

කාර්යසාධන වාර්තාව

2022

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය

මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය - 244

පටුන

1 ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1
1.1 හැඳින්වීම	1
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ අභිමතාර්ථ	1
1.3 ප්‍රධාන කාර්යයන්	2
1.3.1 වෙළඳ ප්‍රතිපත්ති අංශය	2
1.3.2 පාලන හා මූල්‍ය අංශය	5
1.4 2022 දෙසැම්බර් 31 වන දිනට සංවිධාන සටහන	6
2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම	8
2.1 ප්‍රධාන ජයග්‍රහණ සහ අභියෝග	8
3 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය	9
3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	9
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	10
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය	11
3.4 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	12
3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය	18
3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය	18
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, මෙම දෙපාර්තමේන්තුව වෙත වැය දැරීම සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	18
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය - 2022	18
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2022	ඇමුණුම
4 කාර්යසාධන දර්ශක	19
5 තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDGs) සපුරා ගැනීමේ කාර්යසාධනය	21
5.1 තිරසර සංවර්ධන අභිමතාර්ථ	21
6 මානව සම්පත් පැතිකඩ	27
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය	27
6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම	27
6.3 මානව සම්පත් සංවර්ධනය	27
7 අනුකූලතා වාර්තාව	28

1. ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වනුයේ ශ්‍රී ලංකා ආර්ථිකයෙහි සහ ජනතාවගේ ශුභ සාධනය උදෙසා විදේශ වෙළඳාම, ආයෝජන, දේශීය කර්මාන්ත හා කෘෂි කර්මාන්තය සඳහා පහසුකම් සැලසීමට තිරසාර තීරු බදු ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම යි.

තවද ආනයන හා අපනයන රෙගුලාසි, රේගු පරිපාලනය, විදේශ විනිමය නියෝග, සහනදායී පදනම මත මෝටර් රථ ආනයන බලපත්‍ර ක්‍රමය ඇතුළුව තීරු බදු සහන ප්‍රදානය / ඉවත් කිරීම් හා වෙළඳ ගිවිසුම් යටතේ තීරුබදු ලිහිල්කරණය සම්බන්ධිත ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් ද මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ.

1.2 ආයතනික දැක්ම, මෙහෙවර, අරමුණු හා අභිමතාර්ථ

දැක්ම

රටේ සමස්ත සංවර්ධනය උදෙසා වෙළඳාම හා ආයෝජනය තුළ ප්‍රගතිගාමී ප්‍රතිපත්ති ස්ථාපනය කිරීම තහවුරු කිරීම.

මෙහෙවර

රට තුළ සමස්ත සංවර්ධනයක් අත්පත් කරගැනීම සඳහා ජාත්‍යන්තර ආර්ථික ඒකාබද්ධතාවයට ඉඩ සලසන්නා වූ වෙළඳ හා ආයෝජනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.

අරමුණු

- වෙළඳ ප්‍රවර්ධන සහ කර්මාන්ත හිතකාමී තීරුබදු ක්‍රමවේදයක් පවත්වා ගැනීම.
- ව්‍යාපාර පහසු කිරීම් දර්ශකය සඳහා පහසුකම් සැලසීමේ ප්‍රතිපත්ති පවත්වා ගෙන යාම.
- තරඟකාරී වාසි ලැබෙන පරිද්දෙන් වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම.
- රජයේ ආර්ථික හා සමාජීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බදු සහන ක්‍රියාත්මක කිරීම.
- මෙම කලාපය තුළ සෘජු විදේශ ආයෝජන සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම

අභිමතාර්ථ

- වෙළඳ කටයුතු ප්‍රවර්ධනය හා කර්මාන්ත සඳහා හිතකාමී මනා තීරුබදු ක්‍රමවේදයක් ඇති කිරීම.
- ආයෝජන අධෛර්යමත් කරන තීරුබදු සීමා ඉවත් කිරීම.
- අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයනය කිරීම් (TIEP) යෝජනා ක්‍රමය ශක්තිමත් කිරීම.
- බන්ධිත ගුදම් සම්බන්ධිත ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා ප්‍රතිපත්තියක් සැකසීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ සංවාද සංවිධානය කිරීම.
- සේවාලාභීන් සඳහා සහාය වන දත්ත පද්ධතියක් ඔස්සේ අවශ්‍ය තොරතුරු සැපයීම මඟින් ව්‍යවසායකයින්ට සහයෝගය දැක්වීම.
- රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී පදනම මත වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු විධිමත් කිරීම.
- මෙරට වෙළඳ ආර්ථිකයේ අසමමිතික ස්වභාවය තුළ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ මත පදනම් වූ නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම.
- ගෝලීය අගය දාම වෙළඳාම/කර්මාන්ත සඳහා ප්‍රවේශය සලසන නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1.3.1 වෙළඳ ප්‍රතිපත්ති අංශය

වෙළඳ, කර්මාන්ත, කෘෂි කර්මාන්තය හා නිදහස් වෙළඳ ගිවිසුම්වලට අදාළව තීරුබදු ප්‍රතිපත්තිය සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා සංශෝධනය සම්බන්ධයෙන් වෙළඳ ප්‍රතිපත්ති අංශය වගකීම දරනු ලැබේ. රේගු ආඥා පනත යටතේ නියෝග ප්‍රකාශයට පත් කිරීම, රේගු හා තීරුබදු ආශ්‍රිත ගැටලුවලට අදාළ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම ඇතුළුව රේගු පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීම, මෝටර් වාහන ආනයනය සඳහා තීරුබදු සහන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හා විවිධ තීරුබදු සහන යෝජනා ක්‍රම යටතේ ආනයනය කළ වාහන අපහරණය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම මෙම අංශය වෙත පැවරී තිබේ. විදේශ විනිමය පනත යටතේ නියෝග නිකුත් කිරීමේ හා අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධීකරණය, දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානය (SAARC), සාක් සංවර්ධන අරමුදල සහ ලෝක වෙළඳ සංවිධානය (WTO) සමඟ අදාළ කටයුතු සම්බන්ධීකරණය හා එම සංවිධාන තුළ මෙරට නියෝජනය

කිරීම සහ ආනයන හා අපනයන පාලන පනත යටතේ නියෝග හා නියමයන් නිකුත් කිරීමේ දී අදාළ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම ද මෙම දෙපාර්තමේන්තුවට පැවරී තිබේ.

මෙම අංශය මඟින් ඉටුවෙන ප්‍රධාන කාර්යයන් පහත විස්තරාත්මකව දක්වා ඇත;

වෙළඳ ප්‍රතිපත්තිය

i. මෝටර් වාහන ආනයන ප්‍රතිපත්තිය කළමනාකරණය
ii. වෙළඳ කටයුතුවලට අදාළ ජාතික හා අන්තර්ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණය
iii. පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන වෙළඳ කටයුතු ආශ්‍රිත ගැටලු විසඳීම
iv. අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා වෙළඳ ප්‍රතිපත්ති පත්‍රිකා සකස් කිරීම
v. වෙළඳ කටයුතු ආශ්‍රිත අධිකරණ නඩු කටයුතු සඳහා වගඋත්තර සැපයීම
vi. වෙළඳ ප්‍රතිපත්තිය පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශ/ නිරීක්ෂණ සහ මතයන් ඉදිරිපත් කිරීම
vii. වෙළඳ /තීරු බදු සම්බන්ධිත අයවැය යෝජනා සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
viii. රේගු ආඥා පනත යටතේ වන නියමයන් ප්‍රකාශයට පත් කිරීම සඳහා පහසුකම් සැලසීම
ix. විදේශ විනිමය පනත යටතේ නියෝග ප්‍රකාශයට පත් කිරීම / නියමයන් නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසීම
x. තක්සේරු කිරීම් ද ඇතුළුව රේගු කටයුතුවලට අදාළ අභියාචනා සමාලෝචනය කිරීම.
xi. රේගු පරිපාලනය සම්බන්ධිත විගණන වාර්තා සමාලෝචනය
xii. අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයනය කිරීම් යෝජනා ක්‍රමවල ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ සම්බන්ධීකරණය
xiii. බන්ධිත ගුදම් පහසුකම්වල ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධීකරණය
xiv. ආනයන තාර්කිකකරණය පිළිබඳ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධීකරණය
xv. විදේශ විනිමය පනත යටතේ ලැබෙන අභියාචනා සමාලෝචනය කිරීම
xvi. ආනයන හා අපනයන පාලන පනත යටතේ ලැබෙන අභියාචනා සමාලෝචනය කිරීම
xvii. රේගු පරිපාලනය සම්බන්ධිත ද්විපාර්ශ්වික ගිවිසුම් සම්බන්ධීකරණය
xviii. වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම ඇතුළුව ලෝක වෙළඳ සංවිධානය ආශ්‍රිත කරුණු සම්බන්ධීකරණය

තීරුබදු ප්‍රතිපත්තිය

i. රේගු ආඥාපනතේ 19 (අ) වගන්තිය යටතේ ප්‍රදානය කරන තීරුබදු ඉවත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය
ii. ආදායම් සංරක්ෂණ නියෝග ප්‍රකාශයට පත් කිරීම

iii. තීරුබදු විෂමතා ආශ්‍රිතව ඉදිරිපත් කරන ගැටලු විසඳීම

iv. නව ජාතික උප බෙදුම් රේඟු සංකේතාංක කළමනාකරණය

v. සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවලට අනුකූලත්වය හා අතිස්ථාපනය කිරීම්

vi. තීරුබදු ප්‍රතිපත්තිය ආශ්‍රිත ගැටලු හා විකල්ප විශ්ලේෂණය කිරීම

vii. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත ක්‍රියාත්මක කිරීම

viii. තීරුබදු ප්‍රතිපත්තිය සමාලෝචනය හා යාවත්කාලීන කිරීම

ix. තීරුබදු ප්‍රතිපත්තිය සම්බන්ධිත පාර්ලිමේන්තු කටයුතු

x. තීරුබදු කටයුතු හා සම්බන්ධ ජාතික හා අන්තර්ජාතික ආයතන සමඟ සම්බන්ධීකරණය

xi. පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන තීරුබදු ප්‍රතිපත්තිය ආශ්‍රිත ගැටලු විසඳීම

xii. අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා තීරුබදු ප්‍රතිපත්ති පිළිබඳ පත්‍රිකා සැකසීම

xiii. තීරුබදු ප්‍රතිපත්තිය සම්බන්ධිත අධිකරණ නඩු කටයුතු සඳහා වගඋත්තර සකස් කිරීම

නිදහස් වෙළඳ ගිවිසුම්

i. නිදහස් වෙළඳ ගිවිසුම්වලින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය කෙරෙහි වන බලපෑම විශ්ලේෂණය කිරීම

ii. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම්වලට අනුකූලව වෙළඳ ප්‍රතිපත්තිය සමාලෝචනය හා යාවත්කාලීන කිරීම

iii. පහත සඳහන් ගිවිසුම් සම්බන්ධයෙන් තීරුබදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම:

- ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)
- ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA)
- බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාවය සඳහා වූ බහුපාර්ශවීය ගිවිසුම (BIMSTEC)
- යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA), සහ
- ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA)

විශේෂ යෝජනා ව්‍යාපෘති

i. රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී පදනම මත මෝටර්රථ ලබා ගැනීම සඳහා වන යෝජනා ක්‍රමය

ii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22 / 99 යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර

iii. විදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 210 යටතේ, රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සඳහා සහනදායී පදනම මත මෝටර් රථ ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය

iv. විවිධ තීරු බදු සහන යෝජනා ක්‍රම යටතේ ආනයනය කරනු ලැබූ මෝටර් රථ අපහරණය කිරීම

v. රේගු ආඥා පනත යටතේ රේගු බදු ඉවත් කිරීම් ප්‍රදානය කිරීම

vi. අපනයන සැකසුම් යෝජනා ක්‍රමය (TIEP) යටතේ ආනයනය කිරීම්

vii. රේගු බන්ධිත ගුදම් පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදීම සම්බන්ධීකරණය

viii. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සාර්ක් සංවර්ධන අරමුදලෙහි ප්‍රතිපාර්ශවීය ආයතනය ලෙස කටයුතු කිරීම ඇතුළුව සාර්ක් සංවර්ධන අරමුදලේ කටයුතු

ix. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කරුණු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය අනුමත කිරීම් සහ අභියාචනා කටයුතු සම්බන්ධීකරණය කිරීම

1.3.2 පාලන හා මූල්‍ය අංශය

මානව සම්පත්, වත්කම් හා මූල්‍ය සම්පත් කළමනාකරණය සඳහා පාලන හා මූල්‍ය අංශය වගකීම දරනු ලැබේ. දෙපාර්තමේන්තුව තුළ නිලධාරීන්ගේ ස්ථානගත කිරීම්, ධාරිතා සංවර්ධන හා ශුභසාධන කටයුතු මානව සම්පත් කළමනාකරණය යටතේ ඇතුළත් වේ. භෞතික හා මූල්‍ය සම්පත් අත්පත් කරගැනීම, නඩත්තු කිරීම හා වාර්තා පවත්වා ගැනීම භෞතික හා මූල්‍ය සම්පත් කළමනාකරණය යටතේ ආවරණය වේ.

මීට අමතරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, කාර්ය සාධන වාර්තා, වාර්ෂික මූල්‍ය වාර්තා සැකසීම හා විගණන ගැටලු සම්බන්ධිත පසුවිපරම් කටයුතු පාලන හා මූල්‍ය අංශයේ විෂය පථයට ඇතුළත් වේ.

1.4 2022 දෙසැම්බර් 31 දිනට සංවිධාන සටහන



කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සංවිධාන ව්‍යුහය

1.4 2022 දෙසැම්බර් 31 දිනට සංවිධාන සටහන



භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් නිකුත් කරන ලද 2021.01.11 දිනැති අංක DMS/CM02/NTS ලිපිය අනුව

ක

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රධාන ජයග්‍රහණ හා අභියෝග

ශ්‍රී ලංකා ආර්ථිකය සිය මෑත කාලීන ඉතිහාසය තුළ පෙර නොවූ විරූ ආර්ථික, සමාජ හා දේශපාලනික අත්දැකීමකට මුහුණු දෙමින් ඒ ඔස්සේ ඉදිරියට යෑමක් 2022 වර්ෂයේ දී සිදුවිය. ශ්‍රී ලංකාවේ අර්ථිකය 2022 වර්ෂයේ දී 8.8% කින් සංකෝචනය වනු ඇති බවට ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇස්තමේන්තු කරන ලදී. ආර්ථික, සමාජ හා දේශපාලනික පරිසරය තුළ ඇති වූ වෙනස්කම්වලට අමතරව, මෙරට විදේශ විනිමය වෙළඳපොළ තුළ මෙන්ම දේශීය මුදල් වෙළඳපොළහි රුපියල් වලට අදාළව පැවති ද්‍රවශීලතා හිඟය හේතුවෙන් ජාත්‍යන්තර වෙළඳාම ආශ්‍රිත කටයුතු සඳහා පහසුකම් සැපයීමේ දී ශ්‍රී ලංකාව අපහසුතාවයට පත්විය. එබැවින් භාණ්ඩ ආනයනය කිරීම හා විදේශ විනිමය මෙරටින් බැහැරට යෑම් වඩාත් තාර්කිකකරණය සඳහා ආනයන හා අපනයන පාලන පනත යටතේ පියවර හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු තාර්කිකකරණය සඳහා දේශසීමා ආශ්‍රිතව අයකෙරෙන තීරු බදු හා අනෙකුත් බදු සංශෝධනය කිරීම ඇතුළුව පියවර මාලාවක් හඳුන්වා දීම සිදුවිය.

මෙකී සියලු ආකාරවල අසීරුතා මධ්‍යයේ වුව ද, ශ්‍රී ලංකාව විසින් 2022 වර්ෂයේ දී 3.1% ක වාර්ෂික අපනයන වර්ධන වේගයක් සහිතව, ඇමරිකානු ඩොලර් මිලියන 14,946.9 ක අපනයන ආදායමක් ඉපැයූ අතර, එමඟින් එකී වර්ෂයේ වෙළඳ හිඟය අඩුවිය. එසේ වුව ද, දේශීය ආර්ථික ගැටලුවලට අමතරව රුසියානු-යුක්රේන යුද්ධය, කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ ප්‍රතිඵල, ආර්ථික කටයුතු මන්දගාමී වීම ඇතුළුව ගෝලීය වෙළඳපොළ ප්‍රවණතා, ඉහළ ගිය උද්ධමනය, වැඩි වූ පොලී අනුපාතික, භාණ්ඩ සැපයුම්වල හිඟය ආදී වශයෙන් වූ කරුණු හේතුවෙන් අපනයන වර්ධනය තවදුරටත් ඉහළ යෑමේ හැකියාව සීමා කෙරිණි.

කර්මාන්තවලට හා මහජනතාවට අවශ්‍ය කරන අත්‍යවශ්‍ය සැපයුම් දාම සම්බන්ධිතව පැන නැඟි විවිධ ගැටලු විසඳීමට සහ ඒවා විධිමත් ආකාරයෙන් ක්‍රියාත්මක වීමට පහසුකම් සැලසීම සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ හා මුදල් අමාත්‍යවරයාගේ මහ පෙන්වීම යටතේ අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම ඔස්සේ මෙම දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන ලදී.

මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් වෙළඳ සහ ආයෝජන කටයුතු ආශ්‍රිත කාර්යයන් ඉටු කිරීම, මෙම දෙපාර්තමේන්තුව විසින් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව හා අනෙකුත් සම්බන්ධිත ආයතන සමඟ සහයෝගීතාවයෙන් යුතුව ඉටු කරන ලදී.

එසේ වුව ද, තෝරාගත් ඇතැම් ආර්ථික කටයුතුවල මන්දගාමීත්වය, නිරන්තර වෙනස් වීම්වලට ලක් වූ ප්‍රතිපත්තිමය පරිසරය හා විදේශ විනිමය අර්බුදය තුළින් මෙරට වෙළඳ හා ආයෝජන කටයුතු කෙරෙහි දැඩි පීඩනයක් ඇති කරන ලදී.

රට අභ්‍යන්තරිකව සහ ගෝලීය වශයෙන් වෙළඳ හා ආයෝජන කටයුතු සඳහා පැවති අභියෝගාත්මක පරිසරය හමුවේ වුව ද, මහජනතාවට, වෙළඳ හා කාර්මාන්තවලට අවශ්‍ය කෙරෙන සේවා සැපයීම සඳහා අනෙකුත් ප්‍රධාන භාණ්ඩාගාර දෙපාර්තමේන්තු මෙන්ම මෙම දෙපාර්තමේන්තුව ද අඛණ්ඩව කටයුතු කරන ලදී.

කේ.ඒ. විමලේන්තිරරාජා
අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

03. 2022 දෙසැම්බර් **31** වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය



ඒසිස්-එන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	කණ්ඩායම 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිස්-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අයිතම		63,031,000	54,439,000	ඒසිස්-3
-	තැන්පතු		17,275	19,225	ඒසිස්-4
-	අත්තිකාරම් හිඟුම්		4,654,895	5,083,523	ඒසිස්-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් හිඟුම් ලැබීම		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		67,703,170	59,541,748	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		67,703,170	59,541,748	
	භාණ්ඩාගාරයට ශ්‍රේෂණ (ඇ)		49,539	1,209,841	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		67,653,631	58,331,907	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
46,900,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	45,917,056	37,907,672	
17,348,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	16,675,805	11,162,602	ඒසිස්-2(ii)
1,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	717,100	727,655	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
65,248,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		63,309,961	49,797,929	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්				
50,000		10	-	-	
2,100,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	88,550	2,403,494	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිස්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
75,000	හැකියා වර්ධනය	14	55,773	10,000	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
2,225,000	මුළු මූලධන වියදම් (උ)		144,323	2,413,494	
	තැන්පතු ගෙවීම්		17,275	19,225	ඒසිස්-4
	අත්තිකාරම් ගෙවීම්		4,239,406	4,745,909	ඒසිස්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් හිඟුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		4,256,681	4,765,134	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		67,710,965	56,976,557	
67,473,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(57,334)	1,355,349	
	අයිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(57,334)	1,355,349	ඒසිස්-7
	දෙසැම්බර් 31 දිනට අයිම ශේෂය		-	-	ඒසිස්-3
			(57,334)	1,355,349	

3.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

ඒසිඒ-පී

2022 දෙසැම්බර් **31** දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	කණ්ඩායම 2022 රු.	කණ්ඩායම 2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියක හා උපකරණ	ඒසිඒ-6	57,509,361	57,513,693
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	8,187,942	8,603,431
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		65,697,303	66,117,124
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		8,187,942	8,603,431
දේපළ පිරියක හා උපකරණ සංචිතය		57,509,361	57,513,693
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	-
ප්‍රංශම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	-	-
අදාළ ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		65,697,303	66,117,124

පිටු අංක 7 සිට 24 දක්වා ඒසිඒ 2 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 25 31 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුම්මෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදු පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුම්මෙහි සඳහන් සංඛ්‍යා, රීට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත්සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම : කේ.එම්. මහින්ද සිරිවර්ධන	නම : කේ.ඒ. විමලේන්ද්‍රිරාජා	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර : ලේකම්, මුදල් අමාත්‍යාංශය	තනතුර : අධ්‍යක්ෂ ජනරාල්	නම : ඩබ්.ඒ.ඩී.පී. විජේසිංහ
දිනය : 2023.02. 21	දිනය : 2023.02.14	දිනය : 2023.02. 13

කේ.එම්.එම්. සිරිවර්ධන්. ඒ. විමලේන්ද්‍රිරාජා
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ අධීක්ෂණ ජනරාල්
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ/ක්‍රියාත්මක ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

ඩබ්.ඒ. දිමුතු විජේසිංහ
ගණකාධිකාරි
වෙළඳ හා සංවර්ධන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කත්‍ය	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	2,686,986	2,159,715
අග්‍රිම ලැබීම්	63,031,000	54,439,000
අත්තිකාරම් අයකර ගැනීම්	5,271,629	2,754,288
තැන්පතු ලැබීම්	17,275	19,225
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	71,006,890	59,372,228
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	62,446,834	49,067,074
සහනාධාර සහ මාරුකිරීම්	717,100	727,655
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	3,448,186	2,909,724
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	49,539	1,209,841
අත්තිකාරම් ගෙවීම්	4,239,406	3,025,214
තැන්පතු ගෙවීම්	17,275	19,225
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	70,918,340	56,958,734
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	88,550	2,413,494
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	88,550	2,413,494
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	88,550	2,413,494
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(88,550)	(2,413,494)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

ඇමුණුම - (i)

වියදම් ශීර්ෂ අංකය : 244

දෙපාර්තමේන්තුවේ නම : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම්/කපා හැරීම්/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අගය			සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු 25,000.00		අඩු	-	-
රු 25,000.01		වැඩි	1	298,643
එකතුව			1	298,643

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1 CAH 8338 දරන රථය අනාකූරකට ලක්වීම	1	298,643
2	-	-
3	-	-
4	-	-
එකතුව	1	298,643

(ii) කලින් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

අගය			සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු 25,000.00		අඩු	-	-
රු 25,000.01		වැඩි	-	-
එකතුව			-	-

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1	-	-
2	-	-
3	-	-
4	-	-
එකතුව	-	-

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	-
	ගණන	රු
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු

සටහන 1 - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

සටහන 2 - උක්ත දත්ත ඇති සම්පූර්ණ අලාභය රක්ෂණයෙන් පියවාගෙන ඇත.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2023.02.13

* නම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

ඩබ්.ඒ. දිමුතු විජේසිංහ
ගණකාධිකාරි
වෙළඳ හා අයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

ඇමුණුම -(ii)

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 244

දෙපාර්තමේන්තුවේ නම : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

1 **වර්ෂය තුළ සිදුවූ මු.ෙර.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය**

අගය		ඕඩිටි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i)	රු. 25,000.00 අඩු	-	-
(ii)	රු. 25,000.01 වැඩි	-	-
එකතුව		-	-

2 **වර්ෂය තුළ මු.ෙර. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය**

	අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය රු.	අලාභයේ වටිනාකම රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හල අගය රු.	කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම් සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1	-	-	-	-	-	-	-
එකතුව		-	-	-	-	-	-

සටහන - ඇමුණුම් (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.ෙර. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්) /කොමිසාරිස් (මූදල්)
දිනය : 2023.02.13

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව නොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුයි.

ජී. දිමුතු වලේඩිංහ
ගණකාධිකාරි
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

ඇමුණුම - (iii)

දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

දෙපාර්තමේන්තුවේ නම: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 244

වැඩසටහන් අංකය හා නාමය: 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් අංකය	දිනය	ශීර්ෂය	වැඩසටහන	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂයය	අයිතම අංකය	මූල්‍යකරණය	බැඳීම් (රු.) (1)	බැඳීම් ශේෂය (රු.) (2)=(1)-(3)	බැරකම්වලට ඇතුළත් වූ දිනය	බැරකම් වටිනාකම (රු.) (3)	සංශෝධිත බැරකම් (රු.) (4)	බැරකම් නිදහස් කිරීම (රු.) (5)	බැරකම් ශේෂය (රු.) (6)=(4)-(5)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු																
ලේකම්, මුදල් අමාත්‍යාංශය	2022/05	2022.12.31	244	1	1	0	1402		11	63,653	-	2022.12.31	63,653	63,653	-	63,653
ලේකම්, මුදල් අමාත්‍යාංශය	2022/09	2022.12.31	244	1	1	0	1409		11	56,283	-	2022.12.31	56,283	56,283	-	56,283
එකතුව													**119,936**	**119,936**	-	**119,936**
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල																
එකතුව																
3. වෙනත් (පෞද්ගලික අංශය)																
අතිකාල හා අමතර අතිකාල	2022/01	2022.12.31	244	1	1	0	1002		11	78,238	-	2022.12.31	78,238	78,238	-	78,238
නිවාඩු දින දීමනා	2022/02	2022.12.31	244	1	1	0	1002		11	12,084	-	2022.12.31	12,084	12,084	-	12,084
පී.ටී.එම්. තමෝදිනී	2022/03	2022.12.31	244	1	1	0	1003		11	5,500	-	2022.12.31	5,500	5,500	-	5,500
1/3 දීමනාව	2022/04	2022.12.31	244	1	1	0	1003		11	206,718	-	2022.12.31	206,718	206,718	-	206,718
ආර්.එන්.එම්. ඇඩ්වටයිසින්	2022/06	2022.12.31	244	1	1	0	1402		11	11,600	-	2022.12.31	11,600	11,600	-	11,600
කේ.ඒ. වීමලේන්තිරරාජා, අධ්‍යක්ෂ ජනරාල්	2022/07	2022.12.31	244	1	1	0	1402		11	1,752	-	2022.12.31	1,752	1,752	-	1,752
සෙනරත් ඇතුළු නිලධාරීන් සිව් දෙනෙක් සඳහා	2022/08	2022.12.31	244	1	1	0	1101		11	5,950	-	2022.12.31	5,950	5,950	-	5,950
එකතුව													**321,842**	**321,842**	-	**321,842**
මුළු එකතුව													**441,778**	**441,778**	-	**441,778**

ගෙවීම්/බැඳීම්වල ස්වභාවය පහත සඳහන් ආකාරයට හඳුනාගත යුතු ය.

1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු
2. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල
3. පෞද්ගලික අංශය

බැරකම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වත්කම් හා සේවාවන් ලැබී ඇති නමුත් ගිණුම් වර්ෂය තුළදී ඒ සඳහා අදාළ පාර්ශ්වයන්ට ගෙවීම් සිදුකර නොමැති ගනුදෙනුය.

බැඳීම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අදාළ වත්කම් හෝ සේවාව ආයතනය වෙත ලැබී නොමැති, එහෙත් එකී භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේ අරමුණින් බාහිර පාර්ශ්වයන් සමඟ එළඹ ඇති ගිවිසුම් හෝ ලිඛිත එකඟතාවයන්ය.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2023.02. /13

ඩබ්.ඒ. දිමුතු විජේසිංහ
ගණකාධිකාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i)

මු.ගෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය

දෙපාර්තමේන්තුවේ නම: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 244
වැඩසටහන් අංකය හා නාමය: 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.ගෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.ගෙ. 94(3) අනුව මූල පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු								
.....								XX
.....								XX
එකතුව	-	-	-	-	-	-	-	-
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල								
.....								XX
.....								XX
එකතුව	-	-	-	-	-	-	-	-
3. වෙනත් (අපේදගලික අංශය)								
.....								XX
.....								XX
එකතුව	-	-	-	-	-	-	-	-
මූල එකතුව								-

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්) /කොමසාරිස් (මූදල්)
දිනය : 2023.02. 13

ඩබ්.ඒ. දිමුතු විජේසිංහ
ගොනාධිකාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

ඇමුණුම - (vii)

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය

දෙපාර්තමේන්තුවේ නම: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 244

වැඩසටහන් අංකය හා නාමය: 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
-	-	-	-	-

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2023.02. 13

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලංකා විජේසිංහ
ගණකාධිකාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2022.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම් ශීර්ෂ අංකය: 244 දෙපාර්තමේන්තුවේ නම: වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2022.12.31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය	2022.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය	2022.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
			(රු.)	(රු.)		
1	මහජන බැංකුව	014100169026611	2,523,066	-	-	දෙසැම්බර්

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට නහවුරු කරමි.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2023.02.13

ඩබ්.ඒ. දමිතු විලේසිංහ
ගණකාධිකාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - 2022

රු.000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ඇස්තමේන්තුවේ % ලෙස
					අදාළ නොවේ

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

රු.000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් ප්‍රතිපාදනයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
පුනරාවර්තන	59,498	65,248	63,310	97
ප්‍රාග්ධන	2,225	2,225	145	6.5

3.7 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.000

අනු අංකය .	ප්‍රතිපාදනය කවර අමාත්‍යාංශයකින්/ දෙපාර්තමේන්තුවකින් ලැබුනේ ද යන වග	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනයේ %ක් ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	WP CBH - 0478 වාහනය සඳහා ගෙවීම	2,949	2,949	2,910	98.6

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.000

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම් කිරීමට නියමිත	2022.12.31 දිනට ප්‍රගතිය වාර්තා කිරීම
6112	යන්ත්‍රෝපකරණ හා උපකරණ	-	33,411	-	100%

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම් බලන්න.

04. කාර්ය සාධන දර්ශක

අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම		
		100-90%	75-89%	50-74%
01	ද්වී පාර්ශ්වික, පාර්ශව දෙකකට වැඩි නමුත් බහුපාර්ශ්වික නොවන, සහ බහු පාර්ශ්වික වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස		√	
02	යෝජිත වෙළඳ ගිවිසුම් සඳහා පහසුකම් සැලසීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස			√
03	ජාතික සංවර්ධනය සඳහා තිරුබදු ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස	√		
04	අපනයන සඳහා තීරුබදු මාර්ගෝපදේශ නිකුත් කිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස			√
05	සංයෝජිත වර්ගීකරණ සංකේතාංක නව සංස්කරණය - 2022ට අදාළ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස	√		
06	දේශසීමා ආශ්‍රිත රේගු කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී පැන නඟින ගැටලු අතුරින් විසඳූ ගැටලු සංඛ්‍යාව ප්‍රතිශතාත්මක ලෙස	මෙම වර්ෂය තුළ දී ඉල්ලීම්/ ගැටලු කිසිවක් පැනනැඟී නොමැත.		
07	ලෝක වෙළෙඳ සංවිධානයෙහි වෙළෙඳ කටයුතු පහසු කිරීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස	√		
08	කර්මාන්ත/ අනෙකුත් සංවිධාන විසින් ඉදිරිපත් කළ වෙළඳ හා තීරුබදු ආශ්‍රිත ගැටලු අතුරින් (වාර්ෂික අයවැය සඳහා ඉදිරිපත් කළ යෝජනා ද ඇතුළුව) විසඳුම් ලබාදුන් ප්‍රතිශතය	√		
09	අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමවල (TIEP) සිදුකළ සංශෝධන ප්‍රතිශතාත්මක ලෙස scheme	√		
10	අයවැය කතාවේ වෙළඳ ප්‍රතිපත්තියට අදාළ අයවැය යෝජනා අතුරින් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසූ අයවැය යෝජනා සංඛ්‍යාව ප්‍රතිශතාත්මක ලෙස	අයවැය 2022 හි මෙම දෙපාර්තමේන්තුවට අදාළ වන අයවැය යෝජනා නොමැත.		
11	රේගු ආඥා පනතේ ප්‍රතිපාදන යටතේ රේගු ආනයන තීරුබදු ඉවත් කිරීමේ සහන ලබාදීම් ප්‍රතිශතාත්මක ලෙස	√		
12	ද්වීපාර්ශ්වික, පාර්ශව දෙකකට වැඩි නමුත් බහුපාර්ශ්වික නොවන ඒකාබද්ධ වෙළඳ කමිටුව/ කවුන්සිලය තුළ මුදල් අමාත්‍යාංශය නියෝජනය කිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස	√		
13	බන්ධිත ගුදම් ආශ්‍රිත කරුණු ක්‍රියාවට නැංවීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස	√		
14	පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා/ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා ඉදිරිපත් කිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස	√		
15	ඉදිරිපත් කරන ලද පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු/ අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ සකස් කිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස	√		

16	දේශ සීමා/ රේගු කළමනාකරණය පිළිබඳ සංශෝධන සහ අභියාචනා පිළිබඳ කාර්යය නිමකිරීමේ කටයුතු ප්‍රතිශතාත්මක ලෙස	√		
17	2017 අංක 12 දරන විදේශ විනිමය පනත, මූල්‍ය බුද්ධි ඒකකය හා ශ්‍රී ලංකා මහ බැංකුව හා සම්බන්ධිතව ඉදිරිපත් වූ කරුණු සම්බන්ධයෙන් කටයුතු ඉටු කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතාත්මක ලෙස	√		
18	සාක් සංවර්ධන අරමුදලට අදාළ කරුණු සම්බන්ධයෙන් පැවැත් වූ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාවේ ප්‍රතිශතය		√	
19	අනෙකුත් විවිධ කාර්යයන් සඳහා දායකවීමේ කටයුතුවල ප්‍රගතිය ප්‍රතිශතාත්මක ලෙස	√		
20	විවිධ තීරුබදු සහන යෝජනා ක්‍රම යටතේ යටතේ ආනයනය කරනු ලැබූ මෝටර් රථ අතුරින් අපහරණය කිරීමට ලබා දුන් අනුමැතීන්වල ප්‍රගතියේ ප්‍රතිශතය	√		
21	රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සුදුසුකම් සහිත නිලධාරීන් හා පළාත් ආණ්ඩුකාරවරු සඳහා සහනදායී කොන්දේසි යටතේ මෝටර් රථ ආනයනය කිරීම සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතය	√		
22	2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් කර ඇති තොරතුරු ඉල්ලීම් වලින් කටයුතු ඉටු කළ ඉල්ලීම්වල ප්‍රතිශතය	√		
23	මානව සම්පත් කළමනාකරණය යටතේ පවතින පුරප්පාඩු සඳහා බඳවාගත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව	√		
*24	ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව නිමකළ ප්‍රසම්පාදන සංඛ්‍යාවේ ප්‍රතිශතය හා ප්‍රසම්පාදනය සඳහා අයවැය ප්‍රතිපාදන උපයෝජනය වූ ප්‍රතිශතය			√
25	අධිකරණ නඩු කටයුතු අතුරින් සහභාගී වූ/ අවසන් කළ නඩු කටයුතු සංඛ්‍යාවේ ප්‍රතිශතය	√		
26	මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියේ ප්‍රතිශතය	√		
27	දෙපාර්තුමේන්තුවට අදාළ විගණන විමසුම් (රජයේ විගණන, කළමනාකරණ විගණන, අභ්‍යන්තර විගණන) අතුරින් පිළිතුරු සැපයූ විගණන විමසුම් සංඛ්‍යාවේ ප්‍රතිශතය)	√		
28	තොග ලේඛනගත භාණ්ඩ පැවතීමේ සහ වත්කම් සහ තොග ලේඛන කළමනාකරණය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් කිරීමේ ප්‍රතිශතය	√		
29	උපයෝගී සේවාවන් පවත්වාගෙන යෑම සඳහා ඇති වූ බාධාවන්හි ප්‍රතිශතය (දුරකතන, ඉන්ධන, පිරිසුදු කිරීම් සේවා හා තැපැල් සේවා)	√		
30	මාසික සහ කාර්තුමය වාර්තා පිළියෙල කිරීමේ කටයුතුවල ප්‍රතිශතය	√		
31	කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීමේ කටයුතුවල ප්‍රතිශතය	√		
32	කේන්ද්‍රස්ථාන නියෝගවලට අදාළ ඉල්ලීම් අතුරින් කටයුතු ඉටුකළ ඉල්ලීම් සංඛ්‍යාවේ ප්‍රතිශතය	√		

33	තිරසර බලශක්ති සම්බන්ධ අදාළ ඉල්ලීම් අතුරින් කටයුතු ඉටුකළ ඉල්ලීම් සංඛ්‍යාවේ ප්‍රතිශතය	√		
34	වරාය නගරය ආර්ථික කොමිසමට අදාළ ඉල්ලීම් අතුරින් කටයුතු ඉටුකළ ඉල්ලීම් සංඛ්‍යාවේ ප්‍රතිශතය	√		

සටහන: කාර්ය සාධන දර්ශක අංක 24 - "රාජ්‍ය වියදම් පාලනය කිරීම"මැයෙන් වූ ජාතික අයවැය වක්‍රලේඛ 03/2022 අනුව ප්‍රාග්ධන වියදම් සීමා කිරීම"

05. තිරසර සංවර්ධන අභිමතාර්ථ සපුරාගැනීමේ කාර්යසාධනය

තිරසර සංවර්ධන අභිමතාර්ථ							
අනු අංකය	අභිමතාර්ථයට අදාළ අංකය	අභිමතාර්ථය	ඉලක්ක (අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන්)	අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීම සම්බන්ධිත දර්ශක	මේ දක්වා ජයග්‍රහණ අත්කර ගැනීමේ ප්‍රගතිය		
					0%-49%	50%-74%	75%-100%
1	17	තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගිතාවය ක්‍රියාත්මක කළ හැකි විවිධ ක්‍රම හා නව පණු ගැන්වීම් ශක්තිමත් කිරීම	දැනට පවතින ද්වී පාර්ශ්වික, පාර්ශව දෙකකට වැඩි නමුත් බහුපාර්ශ්වික නොවන, සහ බහු පාර්ශ්වික වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම	නිකුත් කරන ලද ආදායම්			√
				සංවේදී ලැයිස්තුව සඳහා සිදුකළ සංශෝධන සංඛ්‍යාව			√
				විසඳනු ලැබූ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධිත ගැටලු සංඛ්‍යාව			√
				සහභාගී වූ රැස්වීම් ගණන			√
2			යෝජිත වෙළඳ ගිවිසුම් සඳහා පහසුකම් සැලසීම	පිළියෙල කළ වාර්තා සංඛ්‍යාව		√	
				සහභාගී වූ රැස්වීම් ගණන		√	
				දායකත්වය දැක් වූ ක්‍රියාකාරකම්වල සංඛ්‍යාත්මක අගය		√	
3			ලෝක වෙළෙඳ සංවිධානයෙහි වෙළෙඳ කටයුතු පහසු කිරීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය ලබා දීම	සහභාගී වූ රැස්වීම් ගණන			√
				ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව			√
				ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය වෙත ඉදිරිපත් කරන ලද රෙගුලාසි/ ලේඛන සංඛ්‍යාව			√

4			ද්වී පාර්ශ්වික, පාර්ශව දෙකකට වැඩි නමුත් බහුපාර්ශ්වික නොවන ඒකාබද්ධ වෙළඳ කම්ටු	සහභාගී වූ රැස්වීම් ගණන			√
				ලැබී ඇති අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව			√
				යෝජිත සංශෝධනවල සංඛ්‍යාත්මක අගය			√
				ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ ගණන			√
5			සාක් සංවර්ධන අරමුදලට (SDF) අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම	අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව		√	
				පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව		√	
6			දේශසීමා/ රේගු කළමනාකරණ ප්‍රතිපත්ති සැකසීම	රේගු ආඥා පනත සඳහා සිදුකළ සංශෝධන සංඛ්‍යාව	මෙම වර්ෂය තුළ දී ඉල්ලීම්/ ගැටලු කිසිවක් පැනනැඟී නොමැත.		
				විභාග කර නිමකළ පැමිණිලි සංඛ්‍යාව			
7			කේන්ද්‍රස්ථාන නියෝගවලට ආදළ ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම	ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව			√
				ලැබී ඇති ඉල්ලීම් අතුරින් අදාළ කටයුතු සිදුකළ ඉල්ලීම්			√
8	**16**	තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියලු දෙනා ඇතුළත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායි, වගකීමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම	පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ සභා/ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව	සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව			√
				ඉදිරිපත් කළ වාර්තා සංඛ්‍යාව			√
9			පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු/ අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ සකස් කිරීම	ලැබී ඇති ප්‍රශ්න සංඛ්‍යාව			√
				පිළිතුරු සපයා ඇති පාර්ලිමේන්තු ප්‍රශ්න සංඛ්‍යාව			√
				ඉල්ලුම් කර ඇති අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ සංඛ්‍යාව			√
				ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ සංඛ්‍යාව			√

10			දේශසීමා/ රේගු කළමනාකරණ කටයුතු සඳහා පහසුකම් සැලසීම	රේගු ආඥා පනත සඳහා සිදුකළ සංශෝධන සංඛ්‍යාව			√
				අවශ්‍ය කටයුතු නිමකළ අභියාචනා සංඛ්‍යාව			√
11			අයවැය කතාවේ වෙළඳ ප්‍රතිපත්තියට අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම කිරීම සඳහා පහසුකම් සැලසීම	පිළියෙල කළ චාර්තා/ රැස්වීම් සටහන්/ ලිපි සංඛ්‍යාව	අයවැය - 2022 හි මෙම දෙපාර්තමේන්තුවට අදාළ වන අයවැය යෝජනා නොමැත		
12			2017 අංක 12 දරන විදේශ විනිමය පනත, මූල්‍ය බුද්ධි ඒකකය හා ශ්‍රී ලංකා මහ බැංකුව හා සම්බන්ධිත අනෙකුත් කරුණු	විදේශ විනිමය පනත සඳහා සිදුකළ සංශෝධනවල සංඛ්‍යාත්මක අගය			√
				නිකුත් කළ නියෝග හා නියමයන් සංඛ්‍යාව			√
				නිකුත් කළ විධාන සංඛ්‍යාව			√
				ලිපි/විමසුම් අතුරින් ප්‍රතිචාර දැක්වූ සංඛ්‍යාව			√
				පහසුකම් සැපයූ ගැටලු සංඛ්‍යාව			√
				ඉල්ලීම් සඳහා අවශ්‍ය කටයුතු ඉටුකළ කළ සංඛ්‍යාව			√
13			කොළඹ වරාය නගරය ආර්ථික කොමිසමට අදාළ ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම	ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව			√
				ලිපි/විමසුම් අතුරින් ප්‍රතිචාර දැක්වූ සංඛ්‍යාව			√
14			2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත	තොරතුරු ඉල්ලීම් අතුරින් පිළිතුරු ලබාදුන් සංඛ්‍යාව			√
				කටයුතු ඉටු කළ අභියාචනා සංඛ්‍යාව			√
15			මානව සම්පත් කළමනාකරණය	පුරප්පාඩු සඳහා බඳවාගත් මානව සම්පත			√

16			ප්‍රසම්පාදන කටයුතු	ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව නිමකළ ප්‍රසම්පාදන කටයුතුවල සංඛ්‍යාත්මක අගයේ ප්‍රතිශතය		√	
				අයවැය ප්‍රතිපාදන උපයෝජනයේ ප්‍රතිශතයක් ලෙස		√	
17			අධිකරණ නඩු කටයුතු	ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබූ නඩු සංඛ්‍යාව			√
				අධිකරණ නඩු කටයුතු			√
18			මුදල් කළමනාකරණය	ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ ප්‍රතිශතය			√
				ලැබූ අත්තිකාරමේ ප්‍රතිශතය			√
				නියමිත කාල ඉලක්කවලට පෙර හෝ එදිනට පිළියෙල කළ ගිණුම්/සාරාංශ/වාර්තාවල සංඛ්‍යාත්මක අගය			√
19			දෙපාර්තුමේන්තුව ට අදාළ විගණන විමසුම් (රජයේ විගණන, කළමනාකරණ විගණන, අභ්‍යන්තර විගණන) සඳහා පිළිතුරු සැපයීම	පිළිතුරු සැපයූ විගණන විමසුම් සංඛ්‍යාව			√
20			වත්කම් හා තොග ලේඛන කළමනාකරණය	තොග අයිතම පැවතීම			√
				නියම කර ඇති කාල සීමාව තුළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම			√
21			උපයෝගී සේවාවන් පවත්වාගෙන යෑම (දුරකථන, ඉන්ධන, පිරිසුදු කිරීම් සේවා හා තැපැල් සේවා)	උපයෝගී සේවාවන් සඳහා ඇතිවූ බාධාවන්හි සංඛ්‍යාත්මක අගය			√
22	**16**	තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ	මාසික සහ කාර්තුමය ප්‍රගති වාර්තා පිළියෙල	පිළියෙල කළ මාසික වාර්තා සංඛ්‍යාව			√

		සියලු දෙනා ඇතුළත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායි, වගකීමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම	කිරීම	පිළියෙල කළ කාර්තුමය වාර්තා සංඛ්‍යාව			√
23			කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම	නියම කර ඇති කාල සීමාව තුළ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීම			√
24			විවිධ කටයුතු	ඉටු කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව			√
25	**12**	පාරිභෝජන හා නිෂ්පාදන රටාවන්හි තිරසාරත්වය සහතික කිරීම	බන්ධිත ගුදම් සම්බන්ධිත ගැටලු	ලැබී ඇති ඉල්ලීම් සංඛ්‍යාව			√
				සංශෝධනය කරන ලද ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සංඛ්‍යාව			√
				ලැබී ඇති ඉල්ලීම් සංඛ්‍යාව			√
				ලබා දී ඇති අනුමැතීන් සංඛ්‍යාව			√
26			තිරසර බලශක්ති කටයුතු සම්බන්ධිත ඉල්ලීම් ඉටු කිරීම	ලැබී ඇති ඉල්ලීම් සංඛ්‍යාව			√
				පිළිතුරු සැපයූ ලිපි/ විමසුම් සංඛ්‍යාව			√
27			විවිධ තීරුබදු සහන යටතේ ආනයනය කළ මෝටර් වාහන අපහරණය කිරීම	ලබා දී ඇති අනුමැතීන් සංඛ්‍යාව			√
28			රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සුදුසුකම් සහිත නිලධාරීන් හා පළාත් ආණ්ඩුකාරවරු සඳහා සහනදායී කොන්දේසි යටතේ මෝටර් රථ ආනයනය කිරීම සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව	චක්‍රලේඛය සඳහා එකතු කළ සංශෝධන සංඛ්‍යාත්මක වශයෙන්			√
				චක්‍ර ලේඛ අංක 01/2018 යටතේ නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව			√
				පිළිතුරු සැපයූ/ අවශ්‍ය කටයුතු සිදුකරන ලද පැමිණිලි සංඛ්‍යාව			√
				පළාත් ආණ්ඩුකාරවරුන් සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව			√
				චක්‍රලේඛ අංක 22/99 යටතේ නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව			√

				තීරුබදු ඉවත් කිරීම්වලට අදාළව නිකුත් කළ ලිපි සංඛ්‍යාව			√
29			අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමවල (TIEP) සිදුකළ සංශෝධන	පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව			√
				පිළියෙල කළ ලේඛන සංඛ්‍යාව			√
30	**12 හා 8**	පාරිභෝජන හා නිෂ්පාදන රටාවන්හි තිරසාරත්වය සහතික කිරීම සහ සියලු දෙනා සඳහා කල්පවත්නා, පූර්ණ හා තිරසර ආර්ථික වර්ධනයක්, සම්පූර්ණ හා ඵලදායී රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම	ජාතික සංවර්ධනය සඳහා තීරුබදු ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම	ආදායම් සංරක්ෂණ ආඥා හා විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට අදාළව නිකුත් කළ ගැසට් නිවේදන සංඛ්‍යාව			√
				ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව			√
31			සංයෝජිත වර්ගීකරණ සංකේතාංක නව සංස්කරණය - 2022	පිළියෙළ කළ ලේඛන සංඛ්‍යාව			√
				සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවලට අදාළ සංශෝධන නිම කිරීම			√
32			අපනයන සඳහා තීරුබදු මාර්ගෝපදේශ නිකුත් කිරීම	පැවැත්වූ රැස්වීම් ගණන		√	
				ප්‍රකාශයට පත්කළ බදු සංඛ්‍යාව		√	
33	**8**	සියලු දෙනා සඳහා කල්පවත්නා, පූර්ණ හා තිරසර ආර්ථික වර්ධනයක්, සම්පූර්ණ හා ඵලදායී රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම	කර්මාන්ත/ අනෙකුත් සංවිධානවලින් ඉදිරිපත් කරන ගැටලු සංඛ්‍යාව	පිළියෙල කරන ලද වාර්තා/ රැස්වීම් සටහන්/ ලිපි සංඛ්‍යාව			√
34			රේගු ආඥා පනතේ විධිවිධාන යටතේ තීරු බදු ඉවත් කිරීම් ප්‍රදානය කිරීම	ප්‍රදානය කළ තීරු බදු ඉවත්කිරීම් සංඛ්‍යාව			√
				විසඳනු ලැබූ ප්‍රතිපත්තිමය ගැටලු ගණන			√
				ප්‍රකාශයට පත්කළ ගැසට් නිවේදන සංඛ්‍යාව			√

06. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

2022 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව

මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	17	17	00
තෘතීයික	04	02	02
ද්විතියික	28	25	03
ප්‍රාථමික	15	12	03
එකතුව	64	56	08

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 64කි. ඒ අනුව ඉහත වගුව මඟින් මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය දක්වා ඇත. 2022 වර්ෂයේ දී අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 08ක් පැවති අතර, දැනට සිටින කාර්ය මණ්ඩලය ඵලදායී අයුරින් යොදා ගැනීම ඔස්සේ දෙපාර්තමේන්තුව විසින් අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගෙන තිබේ. දෙපාර්තමේන්තුවේ කටයුතු ඉටු කිරීමේදී කාර්ය මණ්ඩලයේ හිඟය හේතුවෙන් පැන නඟින සැලකිය යුතු තරම් ගැටලුවලට මෙම දෙපාර්තමේන්තුවට මුහුණ දීමට සිදු නොවිණි.

6.3 මානව සම්පත් සංවර්ධනය

2022 වර්ෂය තුළ දී ආර්ථික අර්බුදය ත්‍රීව්වීම සහ දිගු කාලයක් මුළුල්ලේ පැවති ඉන්ධන අර්බුදය හමුවේ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා පෙර වර්ෂවලට සාපේක්ෂව දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථාවල අඩුවීමක් පැවතිණි.

දෙපාර්තමේන්තුව තුළ ස්වකීය රාජකාරි ඉටු කිරීම සඳහා සේවකයන්ගේ කුසලතා, දැනුම හා ධනාත්මක ආකල්ප වැඩි දියුණු කිරීම සඳහාත්, ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා කැපවීමක් සහිත ධනාත්මක පෞරුෂත්වයකින් හෙබි තැනැත්තන් දෙපාර්තමේන්තුව තුළ වර්ධනය කරගැනීම සඳහා දේශීය හා විදේශීය පුහුණු ලබාදීම වැදගත් වේ.

07. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය කිරීමේ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ.		
1.6	වෙනත්	අදාළ නොවේ.		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අදාළ නොවේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා ලේඛනය (GA — N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම.	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ.		

3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දීම.	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 171/2004 අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ.		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කර තිබීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර තිබීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කර තිබීම	අදාළ නොවේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට දිනට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ.		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) , කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/ 1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කිරීම.	අදාළ නොවේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම.	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ.		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත හා ඌණතා සහ වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදුකර තිබේ.	අනුකූල වේ.		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අදාළ නොවේ.		
9.3	වාහන ලොග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කර ඇත.	අනුකූල වේ.		
9.5	2016.12.29 වන දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හි 3.1 පරිච්ඡේදය අනුව සෑම මෝටර් රථයකම ඉන්ධන දහනය පිළිබඳව නැවත පරීක්ෂා කර තිබීම.	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, අදාළ වාහන සම්බන්ධිත ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අදාළ නොවේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ.		
11.2	මු .රෙ.94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනය උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		

13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ.		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.			
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා යන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නොතිබීම.			
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නො කර සෘජුවම ආදායම් ගිණුමට බැර කර තිබීම.	අදාළ නොවේ.		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අදාළ නොවේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය බඳවාගෙන වැටුප් ගෙවීම් සිදුකර තිබීම.	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ.		
16.3	MSD 04/2017 සහ 2017.09.20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප පියවර හරහා මහජනයා වෙත ලබා දීම හා වෙබ් අඩවිය හරහා හෝ විකල්ප පියවර ඔස්සේ ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ.		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව ආයතනය විසින් පුරවැසි/සේවා ලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.		

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවා ලාභී ප්‍රඥාප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්ම සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ.	නිලධාරීන් 06 දෙනෙකු දෙමළ භාෂා පුහුණු පාඨමාලාවක් සඳහා සහභාගී වීම, මාණ්ඩලික නිලධාරීන් 6 දෙනෙකු ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධිත පාඨමාලාවක් සඳහා සහභාගී වීම සිදුවූ අතර ආර්ථික අර්බුදය හා ඉන්ධන හිහතාවය හමුවේ අපේක්ෂිත මට්ටම කරා පුහුණු වැඩසටහන් පැවැත්විය නොහැකි විය.	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම හා කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම.	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ.		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. TPD/B/DTIP/02/22/28

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 අප්‍රේල් 28 දින

ගණන්දීමේ නිලධාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ශීර්ෂය - 244 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය - 244 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මෙහෙයුම් සමාලෝචනය

2.1 කාර්යසාධනය

2.1.1 කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) භාණ්ඩ වෙළඳාම, සේවා වෙළඳාම, ආයෝජන හා රේගු සහයෝගීතාවය වැනි අනෙකුත් වෙළඳ අංශයන් ද ආවරණය වන පරිදි යෝජනා කරන ලද බහුපාර්ශවීය හා ද්වීපාර්ශවීය වෙළඳ ගිවිසුම් 4කට එළඹීම සඳහා අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා මට්ටමේ පැවතුණු නමුත්, 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 07 ක් ගතවී ඇතත්, අදාළ ගිවිසුම් සඳහා එළඹීම නිම වී නොතිබුණි.

(ආ) **කාර්යසාධන දර්ශක**

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් අපනයන සඳහා තීරුබදු මාර්ගෝපදේශ නිකුත් කිරීම යටතේ අභ්‍යන්තර කටයුතුවලදී භාවිතා කිරීම සඳහා පිළියෙල කර ගැනීමට යෝජිත දත්ත ගොනුව (data sheet) පිළිබඳ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණි.

(ඇ) **ක්‍රියාකාරී සැලැස්මේ භෞතික ප්‍රගතිය**

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන්/ ප්‍රතිපත්තීන් 10ක් හා ඊට අදාළ නිමවුම් සහ දර්ශක 18 ක් සම්බන්ධ සැලසුම්ගත පරිදි භෞතික ප්‍රගතියක් ලබා නොතිබුණ බව නිරීක්ෂණය විය.

4. මානව සම්පත් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 64 ක් වූ අතර, ඉන් තනතුරු 08 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු තනතුරු අතර, තෘතියික මට්ටමේ තනතුරු 02 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 03 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක් ද විය.

බී.ඕ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට